Vidyodaya Journal of Humanities and Social Sciences

VJHSS (2022), Vol. 07 (02)

# An Analysis of Covid-19 Global Pandemic and Sri Lankan Aboriginal Community with Special Reference to Bourdieusian Approach

B. A. L. Kosala[1*] and K. M. I. S. Kumara[2]

[1]Department of Sociology, University of Colombo, [2]Department of Sociology, University of Sri Jayewardenepura, Sri Lanka

**Article Info**

Article History:
Received 05 Jan 2022
Accepted 14 June 2022
Issue Published Online 01 July 2022

**Key Words:**
Covid-19
Sri Lankan Aboriginal-Community
Economic Capital
Social Capital
Cultural & Symbolic-Capitals

*Corresponding author
E-mail address:
lilanthakperera97@gmail.com

https://orcid.org/0000-0001-8540-4968

Journal homepage:
http://journals.sjp.ac.lk/index.php/vjhss

http://doi.org/10.31357/fhss/vjhss.v07i02.10

VJHSS (2022), Vol. 07 (02), pp. 138-152

ISSN 1391-1937/ISSN 2651-0367 (Online)

CC BY

Faculty of Humanities and Social Sciences 2022

## ABSTRACT

*It seems that Sri Lankan aboriginal community had to go through significant hardships during the Covid-19 outbreak. This particular research was conducted in Rathugala aboriginal village in Monaragala district mainly as a qualitative research. The whole research was driven by four major objectives; investigating the social burdens that Rathugala aborigines had to undergo in the pandemic outbreak, the efficacy of the government-sponsored redressing mechanism towards the Rathugala aborigines, the coping strategies employed by Rathugala aborigines to face the unexpected pandemic and its consequences and understanding aforesaid factors through a Bourdieusian perspective. A sample comprising 20 respondents (N=20) was selected under the purposive sampling and sample size was determined by the data saturation point. Data analysis was predominantly carried out as a thematic analysis with a Bourdieusian Approach. The research revelations are as follows; Closing the entrances to the aboriginal village seemingly brought most of the income earnings of the Rathugala aborigines to a halt. Subsequently, it caused the proliferation of the decades-old chronic poverty in Rathugala aboriginal village. Some aboriginal youth have been involved in illegal means of income-earning for their survival as government subsidizing was late and not systematic. The lack of social capital in the Rathugala aboriginal community has made them more deprived of gaining social support from outside of their community. Being aborigines has created a pathetic social perception in the mindset of both the general public and state officials and it might have been a barrier for Rathugala aborigines in the pandemic time when gaining state support.*

**මාතෘකාව**

කොවිඩ් වසංගතය හා ශ්‍රී ලාංකේය ආදිවාසී ප්‍රජාව; බොඩියුසියානු ප්‍රවේශය ඔස්සේ සමාජ විද්‍යාත්මක විමසුමක්

## 1. හැඳින්වීම

කොවිඩ් වසංගතයේ ව්‍යාප්තියත් සමග සමාජය තුළ මෙතෙක් පැවති සමාජ පාන්තික පරතරයන් තවදුරටත් කැපීපෙනෙන සහ ඉස්මතු වූ තත්ත්වයක් පෙන්නුම් කරනු මනාව පෙනේ. ආර්ථිකමය වශයෙන් ස්ථාවර පුද්ගලයන්ට කොවිඩ් වසංගතය සහ ඊට අනුයාත සමාජ දුරස්ථකරණයන්, නිරෝධායන ඇඳිරිනීතිය සහ සංචරණ සීමා යනාදිය කිසිදු අයුරකින් ගැටලුවක් නොවන විට ආර්ථිකමය වශයෙන් විහීන මට්ටමක ස්ථානගතව ඇති පුද්ගලයන්ට ජීවිතය පවත්වාගැනීම පවා සැබැවින් ම බාධාවක් විය. ආර්ථිකමය වශයෙන් ස්ථාවර පුද්ගලයන් වෛරසයට ප්‍රතිරෝධී ආරක්ෂණ අවකාශයක් තුළ රැඳෙන විට දරිද්‍රතාවෙන් පෙළෙන උදවිය එවැනි ආරක්ෂණ අවකාශයක් ගොඩනගා ගැනීමට ඇති නොහැකියාව නිසා ම විවිධාකාර වූ ගැටලුවලට මුහුණ දුන් බව පෙනේ. එබැවින් කොවිඩ් වසංගතය යනු හුදෙක් ජීව විද්‍යාත්මක කතිකාවක් පමණක් නොව සමාජ-ආර්ථික, මනෝ-සමාජයීය හා සමාජ-සංස්කෘතික යනාදී කතිකාවන් ඔස්සේ ද විශ්ලේෂණයට හසුකළ හැකි බහු මුහුණුවරයන්ගෙන් සමන්විත ප්‍රපඤ්චයකි.

මෙකී ශාස්ත්‍රීය උත්සාහයේ දී ශ්‍රී ලංකාවේ වෙසෙන්නා වූ එක්තරා සුවිශේෂිත මානව කණ්ඩායමක් කොවිඩ් වසංගත තත්ත්වය සමග අනුරූප වීමට දැරූ ප්‍රයත්නයන් ශාස්ත්‍රීය ආලෝකයක් තුළට ගෙන ඒමට උත්සාහ දරා ඇත. එකී සුවිශේෂිත මානව කණ්ඩායම නම් ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාව යි. කොවිඩ් සමය තුළ විදෙස් රටවල්හි වාසය කරන ආදිවාසී ප්‍රජාවන් මුහුණ දෙන ගැටලු අළලා එකී රටවල්වල මාධ්‍ය මඟින් විවිධ වැඩසටහන් මෙහෙයවනු දැකගත හැකිවිය (Mercurio, 2020). එකී වැඩසටහන් මඟින් කොවිඩ් තත්ත්වය තුළ එම රටවල්වල ආදිවාසීන් හට මුහුණ පෑමට සිදුව ඇති ගැටලු පිළිබඳව පොදු ජනතාව සවිඥානික කිරීමක් අපේක්ෂා කරන ලදි. නමුත් ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ මෙරට ආදිවාසී ප්‍රජාව කොවිඩ් වසංගතය හමුවේ මුහුණ දුන් ගැටලු සම්බන්ධයෙන් එවන් කිසිදු ආකාරයක අවධානය යොමු කිරීමක් දැකගත නොහැකි විය. රාජ්‍ය මට්ටමින් හෝ රාජ්‍ය නොවන සංවිධාන මට්ටමින් හෝ ශ්‍රී ලාංකේය ආදිවාසී ප්‍රජාවගේ කොවිඩ් වසංගතය ආශ්‍රිත දුක්ගැහැට ආමන්ත්‍රණය කරනු වස් කිසිදු ප්‍රශංසා කටයුතු උත්සාහයක් සඳහා අතපෙවීමක් දැකගත නොහැකි විය. ශ්‍රී ලංකාවේ දඹාන ආදිවාසී ගම්මානයේ නායකතුමන්ගේ හඬ පටයක් හා වීඩියෝ පටයක් රූපවාහිනියේ රාත්‍රී ප්‍රවෘත්ති සේවයන්හි විකාශනය වූවා හැරෙන්නට වසංගත තත්ත්වය තුළ ශ්‍රී ලංකාවේ ආදිවාසීන්ගේ ගැටලු ආමන්ත්‍රණය කිරීමට කිසිදු වේදිකාවක් නිර්මාණය නොවීය. එකී හිඩැස පර්යේෂකයා දුටු බැවින් එම රික්තය පුරවාලීම සඳහා මෙකී පර්යේෂණය සිදුකරන ලදි.

මොනරාගල දිස්ත්‍රික්කයේ රතුගල ආදිවාසී ග්‍රාමය පර්යේෂණ ක්ෂේත්‍රය කොටගනිමින් මෙකී පර්යේෂණය සිදුකර තිබේ. මෙකී ශාස්ත්‍රීය උත්සාහයේ දී අදාළ පර්යේෂණ සොයාගැනීම් බොඩියුසියානු ප්‍රවේශය (Bourdieusian Approach) සමග ගළපා න්‍යාය ගත්වා ඇත. බොඩියුසියානු ප්‍රවේශය තුළ පියර් බෝඩියෝ විසින් ප්‍රාග්ධන ආකාර 4ක් හඳුන්වා දෙනු ලැබ ඇත; ආර්ථික ප්‍රාග්ධනය, සමාජ ප්‍රාග්ධනය, සංස්කෘතික ප්‍රාග්ධනය හා සංකේතාත්මක ප්‍රාග්ධනය (Claridge, 2020). මෙම පර්යේෂණයේ දී ශ්‍රී ලංකාවේ රතුගල ආදිවාසී ප්‍රජාවගේ කොවිඩ් වසංගතය ආශ්‍රිත අභියෝගයන් යටකී ප්‍රාග්ධන ආකාර 4ත් සමග ගළපා ඉදිරිපත් කරනු ලැබ ඇත.

### 1.1 පියර් බෝඩියෝගේ ප්‍රාග්ධන න්‍යාය

මේ යටතේ මූලිකව ම සාකච්ඡා කොට ඇත්තේ මෙකී පර්යේෂණයේ ප්‍රස්තුත න්‍යාය වන 'බෝඩියෝගේ ප්‍රාග්ධන න්‍යාය' (Bourdieu's Theory of Capital) යි. බෝඩියෝගේ ප්‍රාග්ධන න්‍යාය සිව්වැදෑරුම් ප්‍රාග්ධනයන් කෙරෙහි සුවිශේෂ අවධානයක් සහිතව ගැඹුරින් සාකච්ඡා කොට ඇත.

අපගේ එදිනෙදා ව්‍යවහාරයේ දී 'ප්‍රාග්ධනය' (capital) යන යෙදුමෙන් මූලිකව ම අදහස් කෙරෙන්නේ මුදල් හෝ මුදල් බවට පහසුවෙන් ම පරිවර්තනය කළ හැකි අනෙකුත් වත්කම් ය. ප්‍රාග්ධනය යන යෙදුමෙන් අපගේ මනස අත්‍යන්තයෙන් ම සංජානනය කරගනුයේ එම යෙදුමේ පවත්නා මූල්‍යමය අර්ථය පමණි. නමුත් ප්‍රාග්ධනය යන යෙදුම සඳහා සුවිශද අරුත් විවරණයක් පළමුවරට ඉදිරිපත් කරන්නේ පියර් බෝඩියෝ ය. බෝඩියෝ විසින් සිව්වැදෑරුම් ප්‍රාග්ධන ආකෘතියක් ඉදිරිපත් කරනු ලැබූ අතර අද වන විට සමාජීය විද්‍යා විෂයයන් තුළ ඔහුගේ න්‍යාය මෙන්ම ඔහුගේ සිව්වැදෑරුම් ප්‍රාග්ධන ආකෘතිය ද බොහෝ සෙයින් ශාස්ත්‍රීය ඇගයුමට ලක්ව තිබේ.

ආර්ථික ප්‍රාග්ධනය, සමාජ ප්‍රාග්ධනය, සංස්කෘතික ප්‍රාග්ධනය හා සංකේතාත්මක ප්‍රාග්ධනය යන සිව්වැදෑරුම් ප්‍රාග්ධනයන්ගෙන් සමන්විත වන ප්‍රාග්ධන න්‍යායක් බෝඩියෝ විසින් හඳුන්වා දෙනු ලැබීය. මෙකී සිව් වැදෑරුම් ප්‍රාග්ධනයන් විවිධ මට්ටම්වලින් පුද්ගලයන් වටා, පුද්ගල කණ්ඩායම් වටා, සහ සමාජ කණ්ඩායම් වටා ඒකරාශි වී පවතී. බෝඩියෝ ප්‍රාග්ධන න්‍යාය හඳුන්වා දීමට පෙර සමාජයේ ජීවත්වන පොහොසතුන් සහ දුප්පතුන් වෙන්කොට හඳුනා ගැනීමේ මූලික සංරචකයක් ලෙස සැලකුණේ ආර්ථික ප්‍රාග්ධනය පමණි. නමුත් බෝඩියෝ විසින් පෙන්වා දෙන ලද ආකාරයට පුද්ගලයන්ගේ ස්ථාවර සමාජ පැවැත්ම (being better-off) සහ අවදානම් සහගත බව (vulnerability) තීරණය කිරීමට අදාළ වන්නේ ආර්ථික ප්‍රාග්ධනය පමණක් නොවේ. ආර්ථික ප්‍රාග්ධනය හිමි උදවිය අනෙකුත් ප්‍රාග්ධන


ආකාරයන්ගෙන් විහීන විය හැකි ය. එබැවින් පුද්ගලයන්ගේ, පුද්ගල කණ්ඩායම්වල සහ සමස්ත සමාජයක ස්ථාවරත්වය හෝ අවදානම් සහගතභාවය පිළිබඳ සිතුවම පැහැදිලිව අවබෝධ කරගැනීමට නම් යටකී ප්‍රාග්ධන ආකාරයන් හතර ඔස්සේ ම සියුම් සම්මර්ශනයක් සිදුකිරීම අත්‍යවශ්‍ය ය (Jenkins, 1992).

බෝඩියෝ තවදුරටත් පවසන අන්දමට පුද්ගලයෙක් හෝ පුද්ගල කණ්ඩායමක් හෝ යම් ප්‍රජාවක් හෝ සතුව යටකී සිව්වැදෑරුම් ප්‍රාග්ධනයන්ගෙන් කොපමණ ප්‍රමාණයක් පවතී ද එම ප්‍රමාණය වැඩිවීමට අනුලෝමව ඔවුහු වඩ වඩාත් ස්ථාවර වෙති. අවදානම් සහගත භාවයෙන් වඩ වඩාත් ඈත් වෙති (Wilkinson, 2005).


සිව්වැදෑරුම් ප්‍රාග්ධනයන් පිළිබඳව තවදුරටත් අදහස් දක්වන බෝඩියෝ පවසන්නේ මෙම ප්‍රාග්ධන ආකාරයන් හතර තනි තනිව නොව එකට එක්ව ක්‍රියාත්මක වන බව (inter-play) යි (Jenkins, 1992). එලෙස එකට එක්වී ක්‍රියාත්මකවීම මගින් පුද්ගලයෙකුගේ හෝ පුද්ගල කණ්ඩායමක හෝ යම්කිසි ප්‍රජාවක ස්ථාවර භාවය (being better off) හෝ අවදානම්සහගත භාවය (vulnerability) නිර්ණය කරයි.

එමෙන් ම එක් ආකාරයක ප්‍රාග්ධනයක් අත්පත් කරගැනීම තවත් ආකාරයක ප්‍රාග්ධනයක් හෝ ප්‍රාග්ධන ආකාර කිහිපයක් අත්පත් කරගැනීම සඳහා මාර්ගය සකසයි (Jenkins, 1992). එමෙන් ම දැනට තමන් සන්තකව පවත්නා ප්‍රාග්ධන ආකාරයන් මත තමන් ඉදිරියේ දී අත්පත් කරගන්නා ප්‍රාග්ධන ආකාරයන් සහ එම ප්‍රාග්ධන ආකාරයන්ගේ ප්‍රමාණය නිර්ණය වෙයි (Jenkins, 1992).

එබැවින් මෙකී සිව් වැදෑරුම් ප්‍රාග්ධනයන් අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙක මත අන්තර්පරායත්තවන බව පැහැදිලිව කිව හැකි ය. කෙටියෙන් පවසතොත් යම් කිසි සුවිශේෂිත පුද්ගලයෙක් හෝ පුද්ගල කණ්ඩායමක් හෝ පුද්ගල ප්‍රජාවක් විසින් අත්දකිනු ලබන සාපේක්ෂ ශක්තීන් (strenghts) සහ සාපේක්ෂ දුර්වලතාවන් (weaknesses) හඳුනා ගැනීම සඳහා මෙකී සිව්වැදෑරුම් ප්‍රාග්ධන ආකෘතිය උපයෝගී කරගැනීමට හැකි ය (Swartz, 1997). පහතින් දක්වා ඇත්තේ සිව්වැදෑරුම් ප්‍රාග්ධනයන් එකිනෙක සමග අතිපිහිත වන ආකාරය යි.




**රූප සටහන 1.** සිව්වැදෑරුම් ප්‍රාග්ධනයන් එකිනෙක සමග අතිපිහිතවීම




**රූප සටහන 2.** සිව්වැදෑරුම් ප්‍රාග්ධනයන් අත්පත්කරගන්නා ප්‍රමාණය ඉහළ යන විට මිනිසුන්ගේ ස්ථාවරභාවය ද ඉහළ යයි
විහීනතාවට එදිරිව ඇතිහැකි බව
අවදානම් සහගත බවට එදිරිව ස්ථාවරත්වය
බලරහිත බවට එදිරිව බලවත් බව
හඬ රහිත බවට එදිරිව හඬක් ඇති බව
බහිෂ්කරණයට එදිරිව අන්තර්කරණය
නොසළකා හරින ලද බවට එදිරිව අවධානය ලැබෙනසුළු බව

පියර් බෝඩියෝ ප්‍රාග්ධන න්‍යාය තුළ අලුත් යෙදුමක් හඳුන්වා දෙනු ලබයි. 'පුරුදු' (habitus) යනු එම පාරිභාෂික යෙදුම යි. 'habitus' යන ඉංග්‍රීසි වචනයට 'පුරුදු' යන සිංහල නාමය කොතෙක් දුරට අනුරූප වන්නේ ද යන්න පිළිබඳව පර්යේෂකයාට ද ගැටලුවක් පවතින මුත් මෙතැන් සිට ඉදිරියට habitus යන යෙදුමෙහි සිංහල නාමය ලෙස 'පුරුදු' යන්න උපයුක්ත කරගන්නා බව සඳහන් කරමි. සැබැවින් ම පුරුදු යනු බෝඩියෝ පවසන ආකාරයට පුද්ගලයන්ගේ තෝරාගැනීම් නොහොත් වරණයන් (choices) සහ ආකල්ප දිශාගත කරවන්නා වූ යම් ගති ලක්ෂණයකි (Bourdieu, 2006). තවත් ලෙසකින් පවසතොත් පුරුදු යන්න පුද්ගලයන්ගේ පෞරුෂ ලක්ෂණයක් වැනි ය (Bourdieu, 2006). පුද්ගලයාගේ සියලු ම තෝරාගැනීම් සිදුවන්නේ මෙම පුරුදුවලට අනුරූප වන පරිද්දෙනි. පුද්ගලයන්ගේ චර්යා රටාවන්, භාෂා උච්චාරණ රටාවන්, ඔවුන්ගේ ආකල්ප, සිතුම්පැතුම්, විනෝදාංශ ආදී සියල්ලක් ම නිර්ණය වන්නේ පුරුදුවලට අනුරූප වන පරිද්දෙනි (Bourdieu, 2006). බෝඩියෝ විසින් මෙම පුරුදු නිර්මාණය වන ආකාරය පිළිබඳවත් එකී පුරුදු ප්‍රාග්ධන න්‍යායට සම්බන්ධ වන්නේ කෙසේ ද යන්න පිළිබඳවත් සවිස්තරව සඳහන් කොට තිබේ. නිදසුනක් මඟින් මෙය පැහැදිළි කරන්නේ නම් වඩා යෝග්‍ය යැයි හැඟේ. බෝඩියෝ විසින් දක්වන ලද ප්‍රාග්ධන ආකාර හතරෙන් ම ස්වල්ප වූ ප්‍රමාණයක් පමණක් නියෝජනය කරන යම් ප්‍රජාවක් සිටින්නේ යැයි උපකල්පනය කරමු; ස්වල්ප ආර්ථික ප්‍රාග්ධනයක්, ස්වල්ප සමාජ ප්‍රාග්ධනයක්, ස්වල්ප සංස්කෘතික ප්‍රාග්ධනයක් සහ ස්වල්ප සංකේතාත්මක ප්‍රාග්ධනයක් ආදී වශයෙනි. මෙම ප්‍රජාව තුළ පවත්නා එකී ප්‍රාග්ධන හිඟය එකී සමස්ත ප්‍රජාව ම විහීනතාවෙන් යුත් (deprived), හඬක් රහිත (voiceless), බල රහිත (powerless), ආන්තීකෘත (marginalized), බහිෂ්කෘත (excluded), සහ නොසළකා හරින ලද ප්‍රජාවක් (being neglected) බවට පත්කරයි. එම ප්‍රජාවේ ජීවත්වන පුද්ගලයන් කාලාන්තරයක් තිස්සේ මෙකී ආකල්ප සහ අත්දැකීම් අත්දකින නිසා කාලයත් සමඟ ඔවුහු එකී ආකල්ප තම ජීවිතවලට ම අභ්‍යන්තරීකරණය කරගනිති. එකී අභ්‍යන්තරීකරණය කරගත් ආකල්පයන් ඔවුන්ගේ පුද්ගලික හැසිරීම් රටා හා චර්යා රටා මඟින් ප්‍රකාශනය වෙයි. ඒවා ඔවුන්ගේ පෞරුෂයට ම ආවේණික වූ ගති ලක්ෂණ (idiosyncracies) බවට අවසානයේ දී පත්වෙයි. මෙකී සමස්ත ගති ලක්ෂණ සමුදාය බොඩියුසියානු කතිකාව තුළ 'පුරුදු' යන නාමයෙන් හඳුන්වනු ලබයි.

පුද්ගලයන්ව ඔවුන් ජීවත්වන සමාජය විසින් සමාජානුයෝජනය කරනු ලබයි. එක හා සමාන ජීවන මට්ටමක් තුළ ස්ථානගතවන්නා වූ පුද්ගලයන්, එනම් එක හා සමාන සමාජ අවකාශයක් හුවමාරු කරගන්නා පුද්ගලයන්, එක හා සමාන වූ ජීවන රටාවක් අත්විඳීම හේතුවෙන් එක හා සමාන වූ පුරුදු නිර්මාණය කර ගැනීමට වැඩි ඉඩක් පවතී (Bourdieu, 1984).

ප්‍රාග්ධන ආකාර හතරෙන් එක සමාන ප්‍රාග්ධන ප්‍රමාණයක් සහ එක සමාන ප්‍රාග්ධන සංයුතියක් සහිත පුද්ගලයෝ සමාජ අවකාශය තුළ එකිනෙකාට වඩාත් සමීප වන අතර මොවුන් සතුව පවත්නා එක හා සමාන පුරුදු (habitus) හේතුවෙන් මෙම පුද්ගල කණ්ඩායමට සමාජ පන්තියක් බවට පත්වීමේ විභව හැකියාවක් ද පවතී (Bourdieu, 1984).

සිව්වැදෑරුම් ප්‍රාග්ධන ආකාරයන් සහ පුරුදු අතර පවත්නා අන්තර් සම්බන්ධතාව පහත රූපසටහන මඟින් ඉදිරිපත් කර තිබේ




සිව්වැදෑරුම් ප්‍රාග්ධනයන්ගේ උපරිමය - බූෂුවා පුරුදු/ ඉහළ පාන්තික පුරුදු
සිව්වැදෑරුම් ප්‍රාග්ධනයන්ගේ මධ්‍යම ප්‍රමාණය - මධ්‍යම පාන්තික පුරුදු
සිව්වැදෑරුම් ප්‍රාග්ධනයන්ගේ අවම ප්‍රමාණය - ලුම්පිත නිර්ධන පාන්තික පුරුදු

**රූප සටහන 3.** සිව්වැදෑරුම් ප්‍රාග්ධන ආකාරයන් සහ පුරුදු අතර පවත්නා අන්තර් සම්බන්ධතාව

### 1.2 කොවිඩ් වසංගතය ලෝක ආදිවාසී ප්‍රජාවට බලපෑවේ කෙසේ ද? දේශීය සහ විදේශීය ආදිවාසී ප්‍රජාවන්ගේ කොවිඩ් වසංගතය ආශ්‍රිත අත්දැකීම් පිළිබඳව කෙටි සංසන්දනාත්මක විවරණයක්

ලෝකයේ රටවල් ගත්කල ආදිවාසී ප්‍රජාවන් වාසය කරන රටවල් බොහොමයක් ම තිබේ. සෑම රටක ම සාමාන්‍ය ජනයාට සාපේක්ෂව ආදිවාසී කණ්ඩායම් බොහෝවිට ස්ථානගත වන්නේ විහීන ආර්ථික මට්ටමක් මත ය. එබැවින් කොවිඩ් වසංගත තත්ත්වය තුළත් සාමාන්‍ය ජනතාවට සාපේක්ෂව ලෝක ආදිවාසී කණ්ඩායම් වැඩි අවදානම් සහගත භාවයක් පෙන්නුම් කරයි. බොහෝ අවස්ථාවල ආදිවාසී කණ්ඩායම් අදාළ රටවල්වල ස්ථානගත වී ඇත්තේ රටේ කේන්ද්‍රය නොහොත් අගනුවර සහ ප්‍රධාන නගරවල සිට බොහෝ සෙයින් දුරස්ථව ය. රටේ පර්යන්ත ප්‍රදේශවල (peripheral areas) බොහෝ අවස්ථාවල ඔවුන්ගේ වාසස්ථාන ස්ථානගතව පවතී. එබැවින් කොවිඩ් ආසාදිත පුද්ගලයෙක් ආදිවාසි ප්‍රජාවකින් හමු වුව ද ඉක්මන් වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම ආසන්න නගරයක් වෙත පවත්නා දුරස්ථභාවය හේතුවෙන් යම් කාලයක් ප්‍රමාද වෙයි. එබැවින් සාමාන්‍ය ජනතාවට සාපේක්ෂව සෞඛ්‍ය, සෞඛ්‍යාරක්ෂණය සහ සෞඛ්‍ය ප්‍රවේශය අතින් කොවිඩ් වසංගතය ලෝක ආදිවාසී කණ්ඩායම් වඩා අවදානම් අන්තය කරා තල්ලුකර තිබේ. මෙවන් ගැටලු කොවිඩ් වසංගතය තුළ ආදිවාසී කණ්ඩායම් මුහුණ දෙන සාමාන්‍ය ගැටලු වෙයි. මේවාටත් අමතරව උග්‍ර මට්ටමෙහි ලා සැළකිය හැකි ගැටලුවලට ද කොවිඩ් තත්ත්වය තුළ අදිවාසී ප්‍රජාවන්ට මුහුණපාන්නට සිදු වූ බව පැහැදිළි ය. විශේෂයෙන්ම ආන්තිකෘත සමාජ කණ්ඩායමක් වන බැවින් කොවිඩ් වසංගත තත්ත්වය තුළ ඔවුන්ට වාර්ගිකත්වය මුල්කරගත් විවිධ දාමරිකකම්වලට ද මුහුණ දෙන්නට සිදු වූ බව මේ සම්බන්ධයෙන් වන තොරතුරු මූලාශ්‍රය පෙන්වා දෙයි (Palmater, 2020).

කොවිඩ් වසංගත තත්ත්වය තුළ ආදිවාසී ප්‍රජාවන් වෙනුවෙන් ප්‍රශංසනීය වැඩපිළිවෙළක් දියත් කරන ලද රාජ්‍යයක් ලෙස කැනඩාව හඳුනාගත හැකි විය. කැනඩාවේ ආදිවාසී සේවාවන් පිළිබඳ කැබිනට් අමාත්‍යවරයා වන 'Mark Miller' කැනඩා රජය 2020 වර්ෂය තුළ කොවිඩ් වසංගත තත්ත්වයෙන් පීඩාවට පත් ආදිවාසී ප්‍රජාවන් වෙනුවෙන් ආධාර සැපයීම සඳහා රජයේ භාණ්ඩාගාරයෙන් ඩොලර් මිලියන 50 ක මුදල් ප්‍රමාණයක් වෙන් කළ බව ප්‍රකාශ කරයි (Palmater, 2020). ඊට අමතරව කැනේඩියානු රජය ආදිවාසී කණ්ඩායම් වාසය කරන ප්‍රාන්තවල ප්‍රාන්ත ආණ්ඩු සමඟ එකතු වී එකී ආදිවාසී ගම්මානවල දුරකථන කුටි පවා ස්ථාපනය කරන ලදි. ආදිවාසී කණ්ඩායමට මුහුණදීමට සිදුවන ඕනෑම හදිසි අවශ්‍යතාවක දී ප්‍රාන්ත ආණ්ඩුව දැනුවත් කිරීම එහි අරමුණ විය (Palmater, 2020). එමෙන්ම කොවිඩ් වසංගතයේ ආරම්භයත් සමඟ ම ප්‍රාන්ත

ආණ්ඩු තම බල ප්‍රදේශවල වාසය කරන ආදිවාසී කණ්ඩායම්වලට ඔවුන්ගේ ප්‍රවේශයන් වසා දමන ලෙස දැනුම් දීම සිදුකළ අතර ඔවුන්ගේ ප්‍රදේශවලට පැමිණෙන පිටස්තර ජනයාගෙන් ඔවුන්ට රෝගය ව්‍යාප්තවීම වැළැක්වීම මෙහි අරමුණ විය (Palmater, 2020).

මෙවන් සාර්ථක වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වුවත් කැනේඩියානු ආදිවාසී කණ්ඩායම්වලට කොවිඩ් වසංගත තත්ත්වය තුළ විවිධ බාහිර පාර්ශ්වයන්ගේ බලපෑම් ද එල්ල වුණු බව ප්‍රත්‍යක්ෂ ය. කොවිඩ් වසංගතය පැමිණීමට පෙර ආදිවාසී ජනාවාසයන් ආශ්‍රිතව විවිධ පෞද්ගලික සමාගම් මඟින් කැණීම් ව්‍යාපෘති (extractionist projects) සහ බට ලයින් ඇතිරීමේ ව්‍යාපෘති (pipe-line projects) ආදිය ක්‍රියාත්මක කිරීමට උත්සාහ කළ ද ආදිවාසී ප්‍රජාවගේ දැඩි විරෝධය හමුවේ ඒවා නවතා දැමීමට අදාළ පාර්ශ්වයන්ට සිදුවිය (Palmater, 2020). නමුත් කොවිඩ් වසංගත තත්ත්වයත් සමඟ සංචරණ සීමා හා ඇඳිරි නීතිය බලාත්මක කෙරෙන අතරතුර දී ඒවා මුවාවෙන් ඉහත දී නවතා දමන ලද ව්‍යාපෘති නැවතත් ආරම්භ කර රහසේ කරගෙන යෑමට එම පෞද්ගලික සංවිධාන පෙළඹුණු බව පැල්මේටර් සඳහන් කරයි (Palmater, 2020). නමුත් කැනේඩියානු රජය සහ ප්‍රාන්ත ආණ්ඩුවල දුර දක්නා තීන්දු තීරණ ගැනීම හේතුවෙන් එකී ප්‍රයත්නයන් ප්‍රාරම්භක මට්ටමේ දී ම නීත්‍යානුකූල පියවර මඟින් නවතා දැමීමට හැකි විය (Palmater, 2020).

නමුත් ශ්‍රී ලංකාව දෙස බලන විට ශ්‍රී ලංකා රජය මෙරට වාසය කරන ආදිවාසී ප්‍රජාවගේ කොවිඩ් වසංගතය ආශ්‍රිත ගැටලු සහ පීඩාවන් ආමන්ත්‍රණය කිරීම සඳහා කිසිදු විභව වේදිකාවක් නිර්මාණය කිරීමක් දක්නට නොලැබිණි. ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාව ඔවුන්ගේ ජීවන මට්ටම, අධ්‍යාපනය, ස්වස්ථතාව (hygine), සහ ආර්ථිකය ආදී බොහෝ අංශයන්ගෙන් සාමාන්‍ය ජනතාවට සාපේක්ෂව විහීන කලාපයක ස්ථානගතව සිටිති. රටේ කොවිඩ් වසංගත තත්ත්වයක් පැවතුණ ද නොපැවතුණ ද ආදිවාසී ප්‍රජාවගේ ජීවිත සාමාන්‍ය ජනතාවගේ ජීවිතවලට සාපේක්ෂව බොහෝ අවස්ථාවල භංගුර (fragile) ය. එවන් තත්ත්වයක කොවිඩ් වසංගතය ද බලපවත්වන විට ශ්‍රී ලාංකේය ආදිවාසී ප්‍රජාව මුහුණ දෙන ගැටලු ප්‍රගුණනය වීමක් විද්‍යමාන විය (කොවිඩ් ආසාදනය වීමෙන් දඹාන ආදිවාසී ගම්මානයේ ආදිවාසී නායක ඌරුවරිගේ වන්නිල ඇත්තන්ගේ බිරිඳ වන ඌරුවරිගේ හීන් මැණිකා මියයන්නේ ද මෙවන් වකවානුවක ය).

අද වන විටත් ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවගේ එන්නත්කරණය සම්බන්ධයෙන් සංවාදයක් ගොඩනැගී නොමැත (ක්ෂේත්‍ර දත්ත, 2021). එමෙන් ම ශ්‍රී ලාංකේය ආදිවාසී ජනාවාස ආශ්‍රිතව සංවර්ධනයේ නාමයෙන් වනාන්තර එළිපෙහෙළි කිරීම ද ඉහළ ගොස් ඇත. එමෙන්ම හඳුනා නොගත් පිරිස් විසින් ආදිවාසී ප්‍රජාවන්ට ද තර්ජන එල්ල කරමින් ඔවුන්ගේ ජනාවාස ආශ්‍රිත ගංගාවල හා ඔයවල්වල සිදුකරන අනවසර වැලි ගොඩදැමීම් පිළිබඳව ද අසන්නට ලැබෙයි. මේ සියලු ම ගැටලු සම්බන්ධයෙන් ආදිවාසී ප්‍රජාව අදාළ බලධාරීන්ව දැනුවත් කරනු ලැබුවත් එකී ගැටලුවලට මේ වන තෙක් කිසිදු පිළිතුරක් ලැබී නොමැත. මෙකී සියලු ම ගැටලු කොවිඩ් වසංගතයට සමාන්තරව ඊට යටින් දිවෙන සෙවණැලි වසංගතයක් බවට පත්ව තිබේ. එබැවින් මේ සම්බන්ධයෙන් සිදුකරන සමාජ විද්‍යාත්මක පර්යේෂණයක අවශ්‍යතාව පර්යේෂකයාට තදින් ම දැනෙන්නට වූ අතර මෙකී පර්යේෂණය එළි දකින්නේ ඉහත කී ශාස්ත්‍රීය උනන්දුවේ ප්‍රතිඵලයක් ලෙස යි.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙහිදී පර්යේෂකයා විසින් මූලිකව ම ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ සමස්ත පර්යේෂණය සඳහා උපයුක්ත කරගනු ලැබූ පර්යේෂණ ක්‍රමවේදය යි. පර්යේෂණ ක්‍රමවේදය මූලික කොටස් පහක් යටතේ ඉදිරිපත් කොට ඇත. පළමුවෙන් ම පර්යේෂණයට අදාළ පර්යේෂණ පසුබිම සාකච්ඡාවට ලක් කර ඇත. අනතුරුව පිළිවෙළින් පර්යේෂණ ක්ෂේත්‍රය, පර්යේෂණ නියැදිය, දත්ත එකතු කිරීමේ විධික්‍රම හා ශිල්ප ක්‍රම සහ දත්ත විශ්ලේෂණය සිදුකර ඇති ආකාරය සවිස්තරව දක්වා ඇත.

### 2.1 පර්යේෂණ පසුබිම

මෙකී පර්යේෂණ පත්‍රිකාව ආරම්භයේ දී ම සඳහන් කළ පරිදි පර්යේෂකයාගේ ප්‍රධානතම අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවගේ කොවිඩ් වසංගතය ආශ්‍රිත අත්දැකීම් බොඩියුසියානු ප්‍රවේශය (Bourdieusian Approach) ඔස්සේ ශාස්ත්‍රීය සංවාදයකට ගෙන ඒම යි. ඒ අනුව මෙකී අධ්‍යයනයේ පර්යේෂණ පසුබිම මෙලෙසින් ඉදිරිපත් කළ හැකි ය.

ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාව සමාජ මූලාප්‍රවාහයේ මායිම තුළත් (margin of the mainstream) අධිපතිවාදී සංස්කෘතියේ අන්තය තුළත් (edge of the hegemonic culture) ස්ථානගතව සිටිති. එමෙන්ම ඔවුන්ගේ භෞතික වාසස්ථානවල ව්‍යාප්තිය අතින් ද සළකා බලන කල්හි එකී වාසස්ථාන සියල්ල ම පාහේ ව්‍යාප්තව පවතින්නේ රටේ පර්යන්ත ප්‍රදේශවල ය. මෙපරිද්දෙන් සමාජ මූලාප්‍රවාහයේ මායිම තුළත් අධිපතිවාදී සංස්කෘතියේ අන්තය තුළත් පර්යන්ත භූගෝලීය කලාපයන් තුළත් ස්ථානගතවීම හේතුවෙන් ශ්‍රී ලාංකේය ආදිවාසී ප්‍රජාව දෙයාකාර වූ ආන්තිකරණයක් අත්දකිති;

I. සමාජීය ආන්තීකකරණය (Societal marginalization)
II. අවකාශීය ආන්තීකකරණය (Spatial marginalization)

සමාජය යම්කිසි සුවිශේෂිත ප්‍රජාවකට ජාතිය, වාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ආගම වැනි පටු සමාජීය බෙදුම්කාරකයන් (social dividents) මත තම ප්‍රජාවට වඩා වෙනස් ආකාරයෙන් සංග්‍රහ කරනු ලබන විට 'සමාජීය ආන්තිකරණය' සිදුවෙයි. ඒ අනුව ශ්‍රී ලාංකේය ආදිවාසී ප්‍රජාව ඔවුන්ගේ 'ආදිවාසී භාවය' (aboriginality/ vediness) හේතුවෙන් සමාජීය ආන්තිකකරණයට ලක්වනු පෙනෙයි.

යම්කිසි ප්‍රජාවක් රටක සමස්ත සේවාවන්, අවස්ථාවන්, සහ ප්‍රවේශයන් ආදී සියල්ල සමුච්චිත වී පවත්නා රටේ කේන්ද්‍රීය හා පරිපාලනමය ප්‍රදේශයන්ගෙන් ඈත්ව පර්යන්ත ප්‍රදේශවල භූගෝලීයමය වශයෙන් පදිංචිව සිටින විට අවකාශීය ආන්තිකකරණය සිදුවෙයි (Merriam-Webster Dictionary). ඒ අනුව ශ්‍රී ලාංකේය ආදිවාසී ප්‍රජාව ඔවුන් භූගෝලීයමය වශයෙන් ස්ථානගතව ඇති දුරස්ථභාවය හේතුකොටගෙන අවකාශීය ආන්තිකකරණයට ද ලක්වෙති.

මේ අනුව ශ්‍රී ලාංකේය ආදිවාසී ප්‍රජාව ද්විත්ව ආන්තිකකරණයක් (double marginalization) එදා සිට අත්දකින බව ප්‍රත්‍යක්ෂ වෙයි. කොවිඩ් වසංගතය ද රට ආක්‍රමණය කළ මෙවන් කාල වකවානුවක එම තත්ත්වය තවත් උග්‍රවීම අනිවාර්ය ය. එබැවින් පහතින් දක්වා ඇති උප අරමුණු ඔස්සේ මෙකී පර්යේෂණය දියත් කරනු ලැබූ අතර කොවිඩ් වසංගතයෙන් පීඩාවට පත් ශ්‍රී ලාංකේය ආදිවාසී ප්‍රජාවගේ සුවිශද චිත්‍රය නියමාකාරයෙන් ග්‍රහණය කරගැනීම අත්‍යන්තයෙන් ම අපේක්ෂා කරන ලදි.

### 2.2 පර්යේෂණ උප අරමුණු

සමස්ත පර්යේෂණය ම සිදුකරනු ලැබුවේ පහත දක්වන ලද උප අරමුණු ඔස්සේ ය.

I. ශ්‍රී ලාංකේය ආදිවාසී ප්‍රජාව කොවිඩ් වසංගතය ආශ්‍රිතව අත්දකින ලද විවිධ බාධක පියර් බෝඩියෝගේ සිව් ආකාර වූ ප්‍රාග්ධන ආකෘතීන් සමග ගළපා තේරුම් ගැනීම
II. අනපේක්ෂිත ආපදා තත්ත්වය තුළ ශ්‍රී ලාංකේය ආදිවාසී ප්‍රජාවගේ සමාජ ජීවිතය ගලා ගිය ආකාරය සහ ඔවුන්ට අත්විඳින්නට සිදු වූ විවිධාකාර සමාජ ගැටලු මොනවා ද යන්න විමර්ශනය කිරීම
III. ශ්‍රී ලාංකේය රජය ආදිවාසී ප්‍රජාවන් වෙනුවෙන් දියත් කළ ප්‍රතිකර්ම යන්ත්‍රණය (redressing mechanism) සහ ආධාර ලබාදීමේ ක්‍රියාත්මකභාවය පිළිබඳව විමර්ශනය කිරීම
IV. වසංගත තත්ත්වයට අනුවර්තනයවීම සඳහා ශ්‍රී ලාංකේය ආදිවාසී ප්‍රජාව අනුගමනය කරනු ලැබූ අනුවර්තන උපක්‍රම (coping strategies) කවරේ ද යන්න පිළිබඳව සම්මර්ශනය කිරීම වශයෙනි.

### 2.3 පර්යේෂණ ක්ෂේත්‍රය

ශ්‍රී ලංකාව තුළ ආදිවාසී ජනපද කිහිපයක් ම පවතී. ඒවායින් බහුතරයක් ව්‍යාප්තව තිබෙන්නේ ශ්‍රී ලංකාවේ ගිනිකොණ දෙසට වන්නට ය; දඹාන, රතුගල, දානිගල, හේනේබැද්ද, ගල්මැද, සහ බිංගොඩ. ඒ අතරින් පර්යේෂකයා විසින් සිය පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස තෝරාගනු ලැබුවේ ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්ගමුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි රතුගල ආදිවාසී ගම්මානය යි. ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවගේ කේන්ද්‍රය ලෙස ප්‍රචලිතව ඇති දඹාන ආදිවාසී ගම්මානය ද තෝරාගැනීමට ඉඩකඩ තිබුණ ද ඒ වෙනුවට රතුගල ආදිවාසී ගම්මානය සිය පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස තෝරාගත්තේ පහත දක්වා ඇති හේතූන් නිසාවෙනි.

(I) අනෙකුත් ආදිවාසී ගම්මානවලට සාපේක්ෂව රතුගල ආදිවාසී ගම්මානයේ ජීවත්වන ආදිවාසී ප්‍රජාව තවමත් බාහිර ලෝකයත් සමග ගැටෙනුයේ ඉතාමත් අවම වශයෙනි. එබැවින් ඔවුන්ට බාහිර පාර්ශ්වයන්ගෙන් ලැබෙන ආධාර උපකාර ඉතාමත් සීමිත මට්ටමක පවතී.
(II) පර්යේෂණ ක්ෂේත්‍රයට 'පිවිසීමේ පහසුව' රතුගල ආදිවාසී ගම්මානය සම්බන්ධයෙන් ඉතා ඉහළ ය.
(III) අනෙකුත් ආදිවාසී ගම්මානවලට සාපේක්ෂව රතුගල ආදිවාසී ගම්මානය නූතනත්වය සමග දක්වන සංස්පර්ශය ඉතාමත් අවම බව පර්යේෂකයාගේ තේරුම්ගැනීම යි. අදටත් රතුගල ආදිවාසී ප්‍රජාව වනාන්තරය සමග ඉතාමත් සමීප සම්බන්ධතා පවත්වති.

### 2.4 පර්යේෂණ ක්ෂේත්‍රයේ ප්‍රජාවිද්‍යාත්මක තොරතුරු

බිබිල උප නගරයේ සිට කිලෝමීටර 28ක් පමණ දුරින් අම්පාර දෙසට මුහුණලා රතුගල ආදිවාසී ගම්මානය පිහිටා තිබේ. බිබිල-අම්පාර බස් රථයට ගොඩ වීමෙන් මිනිත්තු 45-50ක් වැනි සුළු කාලයක් තුළ රතුගල ආදිවාසී ගම්මානයට ප්‍රවේශ විය හැකි ය.

රතුගල ආදිවාසී ගම්මානය අක්කර 580ක් පමණ ප්‍රදේශයක් පුරා පැතිර පවතී. රතුගල ආදිවාසී ගම්මානයේ සීමාවන් ලෙස කුඹල්ලැව කන්ද, මකරය (එනම් ගල් ඔය සේනානායක සමුද්‍රය සමග එකතු වන ස්ථානය), පොතුලියද්දවෙල සහ කළුගල් පාලම (එනම් අතීතයේ සාදන ලද විශාල කළුගල්වලින් තැනූ පාලමක්) සැළකෙයි. රඹකැන් ඔය රතුගල ආදිවාසී ගම්මානය හරහා ගලා යයි (සම්පත් පැතිකඩ, 2020). රතුගල ආදිවාසී ගම්මානය පළමු වරට ජනාවාස කරන්නේ වර්ෂ 1953 දී දානිගල ආදිවාසී ගම්මානයේ සිට පැමිණි ආදිවාසී ප්‍රජාව විසිනි. සේනානායක සමුද්‍රය නිර්මාණය කිරීමත්

සමග දානිගල ආදිවාසී ගම්මානය ජලයෙන් යටවූයෙන් එහි ජීවත් වූ ආදිවාසී ප්‍රජාව මෙලෙස රතුගල ආදිවාසී ගම්මානයට සංක්‍රමණය වී ජනාවාස පිහිටුවාගෙන තිබේ. අද වන විට රතුගල ආදිවාසී ගම්මානයේ පවුල් 133 ක් ජීවත් වන අතර සමස්ත ජනගහනය 367 කි. ඒ අතරින් පුරුෂයන් 188 ක් වන අතර කාන්තාවන් 189 කි. අද වන විට රතුගල ආදිවාසී ගම්මානයේ පාසල් යන ශිෂ්‍යයෝ 55 දෙනෙක් සිටිති. රතුගල ආදිවාසී ගම්මානයේ වත්මන් නායකතුමා ඩී. එම්. බී. සුදු බණ්ඩා නොහොත් දානිගල මහ බණ්ඩාරලාගේ සුදා වන්නිල ඇත්තෝ ය (සම්පත් පැතිකඩ, 2020).

## 2.5 පර්යේෂණ නියැදිය

මෙකී සමස්ත පර්යේෂණය ම ගුණාත්මක පර්යේෂණයකි. පර්යේෂණයේ උප අරමුණු ද ගුණාත්මක විශ්ලේෂණයක අවශ්‍යතාව මතු කරයි. එබැවින් පර්යේෂණ නියැදිය තෝරාගැනීම ද ගුණාත්මක පර්යේෂණයක් සිදුකිරීමේ අවශ්‍යතාව විසින් මෙහෙයවන ලදි. ඒ අනුව අරමුණු සහගත නියැදීම (purposive sampling) යටතේ ප්‍රතිචාරිකයන් 20 දෙනෙකුගෙන් සමන්විත වන නියැදියක් පර්යේෂකයා විසින් තෝරාගැනීම සිදුකරන ලදි. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මානයේ ඇති වැදගත්කම ද සැළකිල්ලට ගනිමින් තෝරාගත් නියැදිය පුරුෂයන් 10 දෙනෙකුගෙන් සහ කාන්තාවන් 10 දෙනෙකුගෙන් සමන්විත කරන ලදි. නියැදි ප්‍රමාණය (sample size) ආරම්භයේ දී ම තීරණය නොකළ අතර දත්ත සංතෘප්ත අවස්ථාව (data saturation point) සළකා එය තීරණය කරන ලදි.

## 2.6 දත්ත ඒකරාශීකිරීම

පර්යේෂණ නියැදිය තෝරාගැනීමේ දී මෙන්ම දත්ත එකතු කිරීමේ විධික්‍රම සහ ශිල්ප ක්‍රම තෝරාගැනීමේ දී ද ගුණාත්මක පර්යේෂණයක් සිදුකිරීමේ අවශ්‍යතාව විසින් එම තෝරාගැනීම් මෙහෙයවන ලදි. ඒ අනුව සහභාගීත්ව නොවන නිරීක්ෂණය (non-participant observation), ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා (un-structured interviews), ගැඹුරු සම්මුඛ සාකච්ඡා (in-depth interviews) සහ ප්‍රත්‍යෙක අධ්‍යයනයන් (case studies) මූලික වශයෙන් උපයුක්ත කරගනු ලැබිණි. ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා සහ ගැඹුරු සම්මුඛ සාකච්ඡාවන් සිදුකිරීමේ දී සම්මුඛ සාකච්ඡා උප ලේඛනයක් (pre-prepared interview schedule) ඇසුරෙන් ඒවා සිදුකරනු ලැබිණි. ආදිවාසී ගම්මානයේ නායකතුමන්ගෙන් දත්ත ලබාගැනීමේ දී ගැඹුරු සම්මුඛ සාකච්ඡා සහ ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා යන ක්‍රම දෙක ම උපයෝගී කරගනු ලැබිණි. එමෙන්ම ආදිවාසී නායකතුමන් විසින් පර්යේෂකයාව හමුවන ලෙස යොමු කරන ලද පුරුෂයන් සහ කාන්තාවන් කිහිපදෙනෙකුගෙන් දත්ත ලබාගැනීමේ දී ද ගැඹුරු සම්මුඛ සාකච්ඡා සහ ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා භාවිත කරන ලදි. අවශ්‍යතාව අනුව ප්‍රතිග්‍රාහකයන් විසි දෙනාගෙන් තෝරාගත් කිහිප දෙනෙකු සඳහා ප්‍රත්‍යෙක අධ්‍යයනයන් ද සිදුකරන ලදි. පර්යේෂණය සිදුවන සමස්ත කාල සීමාව පුරාවට ම සහභාගී නොවන නිරීක්ෂණය යටතේ හැකිතාක් දත්ත එක්රැස් කරගැනීමට ද පර්යේෂකයා විසින් වගබලාගන්නා ලදි.

## 2.7 දත්ත විශ්ලේෂණය

ඒකරාශී කරන ලද දත්ත සියල්ල ම අත්‍යන්තයෙන් ම ගුණාත්මක දත්ත විය. දත්ත විශ්ලේෂණයේ දී පර්යේෂකයා විසින් තේමා අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය (thematic content analysis method) උපයුක්ත කරගනු ලැබ තිබේ. එමෙන්ම අවශ්‍ය තන්හි දී ප්‍රතිචාරිකයන්ගේ උද්ධෘත (verbatim quotes) ද ඉදිරිපත් කරමින් සාකච්ඡාව සිදුකරනු ලැබ තිබේ.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

මෙතැන් සිට ඉදිරියට පර්යේෂකයා විසින් ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ පර්යේෂණ සොයාගැනීම් ය. මේ යටතේ රතුගල ආදිවාසී ප්‍රජාවගේ කොවිඩ් වසංගතය ආශ්‍රිත අත්දැකීම් පියර් බෝඩියෝගේ ප්‍රාග්ධන න්‍යායත් සමග ගළපා සාකච්ඡාවට හසුකර තිබේ. මෙකී සාකච්ඡාව තේමාවන්වලට බණ්ඩනය කොටගෙන පෙළගස්වා තිබේ. බෝඩියෝගේ ප්‍රාග්ධන න්‍යාය රතුගල ආදිවාසි ප්‍රජාවගේ කොවිඩ් වසංගතය ආශ්‍රිත අත්දැකීම් සමග සම්බන්ධ කරන ආකාරය මෙතැන් සිට ඉදිරියට සාකච්ඡාවට හසුකර තිබේ.

## 3.1 ආර්ථික ප්‍රාග්ධනය, කොවිඩ් වසංගතය සහ රතුගල ආදිවාසී ප්‍රජාව

ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාව අතර පවත්නා ගෝත්‍රික බණ්ඩනයන් - දඹාන ආදිවාසී ප්‍රජාව, රතුගල ආදිවාසී ප්‍රජාව, හේනෙබැද්ද ආදිවාසී ප්‍රජාව ආදී වශයෙන් - පසෙකලා ඔවුන් සියල්ලන්ව ම එක් මානව කොට්ඨාසයක් වශයෙන් සැළකු විට පැහැදිළි වන සුවිශද කරුණ නම් ඔවුන් සියල්ලන් ම දරිද්‍රතාව විසින් ඇති කරන ලද විහීනතාවන්ගෙන් කාලාන්තරයක් තිස්සේ පෙළෙන බව යි - ප්‍රමාණවත් නොවන ආර්ථික ප්‍රාග්ධනය. ඔවුන්ගේ පූර්වගාමීන් මෙන්ම වර්තමානය තුළ ඔවුන්වත් පීඩාවට පත්කොට ඇති ප්‍රමුඛතම පෙළේ ගැටලුව වන්නේ ඔවුන්ගේ ජීවිත වෙළාගෙන සිටින නිදන්ගත දරිද්‍රතාව යි.

රතුගල ආදිවාසී ප්‍රජාව ද ආර්ථික ගැටලු හේතුවෙන් දැඩි ලෙස පීඩාවට පත්වූ හා අදටත් පීඩාවට පත්වන මානව කොට්ඨාසයකි. ඔවුන්ගේ ජනපදයෙහි නිවාස බොහොමයක් තවමත් සම්පූර්ණ කර අවසන් නොකරන ලද නිවෙස්වලින් සමන්විත ය. එමෙන්ම

තවමත් ඔවුන්ගේ ගම්මානය තුළ සැළකිය යුතු සංඛ්‍යාවක් වරිච්චි බිත්ති සහිත නිවාස ද පවතී. රතුගල ආදිවාසී ප්‍රජාව සමඟ කරන ලද සාකච්ඡාවලින් පර්යේෂකයාට හෙළි වූ එක් කරුණක් වන්නේ රතුගල ආදිවාසී ජනපදයේ ඇතැම් නිවාස සඳහා අදටත් වැසිකිළි පහසුකම් පවා නොමැති බව යි. එකී නිවාසවල වාසය කරන්නන් ඔවුන්ගේ පරිවෘත්තීය කටයුතු සඳහා යාබද වනාන්තරය භාවිත කරන බව ද දැනගැනීමට හැකි විය. එබැවින් රතුගල ආදිවාසී ප්‍රජාවගේ ආර්ථික මට්ටම තේරුම් ගැනීමට මෙය ම ප්‍රමාණවත් ය. කොවිඩ් වසංගතය පැමිණීමට පෙරත් ඔවුන් ප්‍රමාණවත් නොවන ආර්ථිකය නිසා බැට කෑ පිරිසකි. එවන් තත්ත්වයක් තුළ කොවිඩ් වසංගතය පැමිණීම හේතුවෙන් ඔවුන්ගේ ආර්ථික ගැටලු තවදුරටත් උඩුදුවා ගිය තත්ත්වයකට පත් වූ බව පෙනෙයි.

“මහත්තයෝ, අපි ඇත්තට ම කලින් ජීවත් වුණේ කුලී වැඩක් කරලා. නැත්නම් මී පැණි, අරළු, බුළු, නෙල්ලි වගේ දෙයක් විකුණලා. එහෙමත් නැත්තන් පොඩි කඩ කෑල්ලක් කරලා. කොරෝන එක්ක අපි කර කර ඉඳපු ඒ වැඩ ඔක්කොම අඩාල වුණා. පිටස්තරයෝ ගමට එන එක නවත්තන්න අපිට ගම වහලා දාන්න වුණා. අපි කල්තියා ම දැනගත්ත පිටස්තරයෝ එන්නැති උනහම අපිට අපේ කඩේකින් බඩුවක්වත් විකුණගන්න වෙන්නෙ නෑ කියලා. ඒත් ඒ ඔක්කොට ම කලින් අපිට අපේ ජීවිත ගැන ළමයින්ගේ ජීවිත ගැන හිතන්න වුණා. කොරෝනා පළවෙනි රැල්ල දෙවැනි රැල්ල කාලෙ දි අපේ ගමේ වේල් තුනෙන් එක වේලක්වත් කන්න නැති වෙච්ච ගෙවලුත් තිබුණා. ඒ තරම් අපි ඒ කාලෙ අසරණ වුණා” (ක්ෂේත්‍ර දත්ත 18/07/2021).

රතුගල ආදිවාසී ගම්මානයේ නායකතුමන් විසින් සිදුකරන ලද ඉහත ප්‍රකාශයෙන් පැහැදිළි වන්නේ ඔවුන් සතුව පවත්නා ආර්ථික ප්‍රාග්ධනයේ හිඟකම වසංගත තත්ත්වය තුළ ඔවුන්ගේ පැවැත්ම දරුණු ලෙස අභියෝගයට ලක්කළ බවයි. පර්යේෂකයා විසින් මීට ඉහත දී ද සඳහන් කළ පරිදි ආර්ථිකමය වශයෙන් ස්ථාවර පුද්ගලයන්ට ඇඳිරි නීතිය, සංචරණ සීමා, සහ රට වැසීම විනෝදාස්වාදය සහ විවේකය සපයද්දී දරිද්‍රතාවෙන් පෙළෙන උදවියට ඒවා දැනට පෙළෙන ජීවන බරට තවත් අමතර බරක් එකතුවීමක් පමණි.

මීට ඉහතදී ද පර්යේෂකයා සඳහන් කළේ ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාව ද්විත්ව ආන්තීකකරණයකින් (double marginalization) පෙළෙන බව යි. මෙකී ද්විත්ව ආන්තීකකරණය තවදුරටත් දරිද්‍රතාව විසින් ඇති කරන ලද ගැටලු සමඟ එකට වෙළුණු විට එය ත්‍රිත්ව ආන්තීකකරණයක් බවට පත්වනු පෙනෙයි. ශ්‍රී ලාංකේය ආදිවාසී ප්‍රජාව 'ආදිවාසීන් වීම' නිසා පළමුව සමාජ ආන්තීකරණයට (societal marginalization) ලක්වෙති. රටේ පර්යන්ත භූමි භාගයේ ජනාවාස පිහිටුවාගෙන සිටීම නිසා දෙවනුව ඔවුහු අවකාශීය ආන්තීකකරණයට (spatial marginalization) ලක්වෙති. පරම්පරා ගණනාවක් තිස්සේ ඔවුන්ව අත්හැර නොයන නිදන්ගත දරිද්‍රතාව හේතුවෙන් තුන්වනුව ඔවුහු ආර්ථික ආන්තීකකරණයට (economic marginalization) ද ලක්වෙති.

කොවිඩ් වසංගත තත්ත්වය තුළ ආර්ථික අපහසුතා මුවවිට දක්වා වර්ධනය වන අවකාශයක දී රතුගල ආදිවාසී ගම්මානයේ ඇතැම් තරුණයන් සුළු මුදලක් හෝ උපයා ගැනීමේ අරමුණෙන් හොර අරක්කු පෙරීම, රඹකැන් ඔයෙහි වැලි ගොඩදැමීම වැනි නීත්‍යනුකූල නොවන ආදායම් ඉපයීමේ මාර්ග වෙතට ද යොමු වූ බව අනාවරණය විය. ඔවුන්ට එකී කාර්යයන්හි වැඩි දිනක් නිරතවීමට නොහැකි වූ අතර පොලීසිය සහ වනජීවී නිලධාරීන්ගේ හදිසි වැටලීම් හමුවේ ඒවා නවතා දැමීමට සිදු වූ බව ද ඔවුහු පැවසූහ (ක්ෂේත්‍ර දත්ත 18/07/2021).

බෝඩියෝගේ ප්‍රාග්ධන න්‍යායේ ආලෝකය තුළ අවසාන වශයෙන් නිගමනය කළ හැක්කේ රතුගල ආදිවාසී ප්‍රජාව සතුව එවකට පැවති ආර්ථික ප්‍රාග්ධනයේ හිඟතාව වසංගත තත්ත්වය තුළ ඔවුන්ව දරුණු ලෙස පීඩාවට පත්කළ බව යි. ඔවුන් සතුව එවකට පැවති ආර්ථික ප්‍රාග්ධනය ඊට වඩා සාපේක්ෂව ඉහළ තලයක වූවා නම් කොවිඩ් වසංගතය ආශ්‍රිත ඔවුන්ගේ ආර්ථිකමය පෙළීම් මීට වඩා අඩුවන්නට ඉඩකඩ තිබිණි.

### 3.2 සමාජ ප්‍රාග්ධනය, කොවිඩ් වසංගතය සහ රතුගල ආදිවාසී ප්‍රජාව

බෝඩියෝට අනුව සමාජ ප්‍රාග්ධනය යනුවෙන් අදහස් කරන්නේ සමාජ ජාලවල පවත්නා අන්තර් පුද්ගල සම්බන්ධතා හේතුවෙන් ඇතිවන දැනහැඳුනුම්කම් ය (Bourdieu, 1986). මේ අනුව බලන කල්හි රතුගල ආදිවාසී ප්‍රජාව සතුව පවත්නා සමාජ ප්‍රාග්ධනය මූලික ආකාර දෙකක් ඔස්සේ හඳුනාගත හැකි ය.

I. අන්තඃ සමාජ ප්‍රාග්ධනය Intra social capital
II. අන්තර් සමාජ ප්‍රාග්ධනය Inter social capital

අන්තඃ සමාජ ප්‍රාග්ධනය යන්නෙන් අදහස් කරන්නේ රතුගල ආදිවාසී ප්‍රජාව තම ප්‍රජාව අතර ම ගොඩනඟාගෙන තිබෙන දැනහැඳුනුම්කම් හා හිතවත්කම් ය. අන්තර් සමාජ ප්‍රාග්ධනය යන්නෙන් අදහස් කරන්නේ රතුගල ආදිවාසී ප්‍රජාව තම ප්‍රජාවට පරිබාහිරින් බාහිර ප්‍රජාවත් සමඟ ඇතිකරගෙන තිබෙන දැනහැඳුනුම්කම් ය. පර්යේෂණ සොයාගැනීම්වලින් හෙළිදරව් වූයේ රතුගල ආදිවාසී ප්‍රජාවේ අන්තඃ සමාජ ප්‍රාග්ධනය වඩාත් ශක්තිමත් වන බව යි. එයින් අදහස් වන්නේ බාහිර සමාජයත් සමඟ ගොඩනඟාගෙන තිබෙන දැනහැඳුනුම්කම්වලට වඩා තමන්ගේ ම ප්‍රජාව සමඟ ඔවුන් ඉතාමත් හොඳින් අනුකලනය වී සිටින බවකි.

තම ප්‍රජාව අතර හොඳ සමාජ සංශක්තික භාවයක් පවතින බවකි.

**රතුගල ආදිවාසී ප්‍රාජාවේ,**
**අන්තඃසමාජ ප්‍රාග්ධනය > අන්තර් සමාජ ප්‍රාග්ධනය**

"අපේ මුළු ගම ම නෑ වෙනවා. හැම ගෑනු කෙනෙක් ම හැම පිරිමියෙක් ම දුරින් හරි හැමෝට ම ඥාතියෙක් වෙනවා. ඒ හින්ද මට මතක ඇති කාලෙක අපේ ගමේ කවදාවත් පවුල් බෙදිල රණ්ඩු කරල නෑ. කොරෝන කාලේ අපිට රජයෙන් මොකුත් ආධාර නොලැබුණත් අපි පුලුවන් විදිහට එක එක්කෙනාට උදව් කරගත්ත. මට තියනවා පොඩි සිල්ලර කඩයක්. මම කොරෝනා දවස්වල තුන්වේල පවා කන්න නැති විදිහට අසරණ වෙච්ච අපේ ගමේ පවුල් කීපෙකට ම සල්ලිවත් ගන්නැතුව පොළියක් බලාපොරොත්තු වෙන්නෙත් නැතුව කඩෙන් නිකං බඩු දුන්නා" (ක්ෂේත්‍ර දත්ත 18/07/2021).

පර්යේෂකයාගේ නියැදියේ බහුතරයක් ප්‍රතිග්‍රාහකයන් ප්‍රකාශ කළේ කොවිඩ් තත්ත්වය තුළ තමන් පිළිබඳව සොයාබැලීම සඳහා දිස්ත්‍රික් ලේකම්තුමන් හෝ ප්‍රාදේශීය ලේකම්තුමන් හෝ පවා තම ගම්මානය වෙත නොපැමිණි බව යි. මේ අනුව පැහැදිළි වන්නේ රතුගල ආදිවාසී ප්‍රජාවගේ අන්තර් සමාජ ප්‍රාග්ධනය එතරම් සවිමත් නොවන බව සහ කොවිඩ් වාතාවරණය තුළ ඔවුන්ට එමගින් සැළකිය යුතු මෙහෙවරක් සිදුනොවුණු බව යි.

රතුගල ආදිවාසී ගම්මානයේ නායක සුදා වන්නිල ඇත්තන් සමඟ කළ සම්මුඛ සාකච්ඡාවේ දී පහත කරුණ පිළිබඳව ඔහු විසින් පර්යේෂකයාව දැනුවත් කරන ලදි.

"පහුගිය අවුරුද්දෙ (2020) මැද විතර හදිස්සියෙ ම මිනිස්සු කට්ටියක් අපේ ගමට ඇවිල්ලා අපේ ගමට එහා පැත්තෙන් තියෙන කැලෑව මනින්න පටන් ගත්ත. අපි ඒ ගැන ඇහුවත් අපිට හරියට උත්තරයක් දුන්නෙත් නෑ. දැන් ඒගොල්ලො ඒ මැනපු බිම් කැල්ලෙ බිල්ඩින් එකක් හදනවා. අපි හිතන්නේ ඒක හෝටලයක් වෙන්න ඕන. සුද්දො ටිකකුත් එතන වැඩ කරනවා. අපි ඉතින් ඇත්තට ම මේ ගැන බය වුණා. ඒගොල්ලන්ට ඒගොල්ලො කැමති ඕන ම දෙයක් කරන්න පුළුවන්, කොවිඩ් හැදුණත් ඒගොල්ලන්ට ඒක ප්‍රශ්නයක් නැහැ, සල්ලි තියෙන හින්ද. අපි දුප්පත් මිනිස්සු. ඒ හින්දා අපි ප්‍රවේසම් වෙන්න ඕනෙ. ඒ හින්දා අපි මුලින් ම පොලීසියෙ මහත්තුරුන්ට මේ ගැන කිව්වා. හැබැයි අපේ වචන නෙමෙයි ඒ මහත්තුරු කනකටවත් ගත්තෙ" (ක්ෂේත්‍ර දත්ත 18/07/2021).

වන්නිල ඇත්තන්ගේ ප්‍රකාශයෙන් පැහැදිළි වන එක් කාරණාවක් තිබේ. එනම් ඔවුන් ස්ථානගතව ඇති සමාජ අනුස්ථානය හේතුවෙන් ඇතැම් අවස්ථාවල නීතියෙන් පවා ඔවුන්ට පිළිසරණක් අහිමිව යන බව යි. පර්යේෂකයා උපකල්පනය කරන පරිදි ඉදිකෙරෙන හෝටලයේ අයිතිකරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ පොලිස් නිලධාරීන් යන දෙපාර්ශ්වය අතර ම හොඳ දැනහඳුනාගැනීමක් සහ ශක්තිමත් මිත්‍රත්වයක් පවතිනවා විය හැකි ය. රතුගල ආදිවාසී ප්‍රජාව තුළ පවත්නා හඬක් නැගීමේ නොහැකියාව හේතුවෙන් මොවුන්ට මොවුන්ගේ කාර්යයන් කිසිදු බාධාවකින් තොරව සිදුකරගෙන යාමට හැකියාව ලැබී ඇත. මේ සම්බන්ධයෙන් රතුගල ආදිවාසී ප්‍රජාවට සවියක් වීම සඳහා ඉදිරිපත්වන වෙනත් කිසිදු බාහිර පාර්ශ්වයක් ද හඳුනාගත නොහැකි ය. එබැවින් රතුගල ආදිවාසී ප්‍රජාවට උරුමව ඇත්තේ තමන්ගේ ඇස්පනාපිට තමන්ට පරම්පරාවෙන් උරුම වූ වනාන්තරය විනාශ වනු බලා සිටීම පමණි.

රතුගල ආදිවාසී ප්‍රජාවටත් බාහිර පාර්ශ්වයන් සමඟ හොඳ දැනහඳුනාගැනීම් තිබුණි නම් මේ සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කර පොදු ජනතාව සවිඥානික කිරීමක් සිදුකොට සහනයක් ලබාගැනීමට හෝ හැකියාවක් පැවතිණි. නමුත් ඔවුන්ගේ සමාජ ජාල සම්බන්ධතා තමන්ගේ ජනපදයෙන් බාහිරට විහිද යාම ඉතාමත් ම අවම බැවින් සමාජ ප්‍රාග්ධනය අතින් හීන තලයක ස්ථානගත වන ඔවුනට කොවිඩ් වසංගත තත්ත්වය තුළ ගැටලු රාශියකට මුහුණ පාන්නට සිදු වූ බව පෙනෙයි.

### 3.3 සංස්කෘතික ප්‍රාග්ධනය, කොවිඩ් වසංගතය සහ රතුගල ආදිවාසී ප්‍රජාව

බෝඩියෝ සංස්කෘතික ප්‍රාග්ධනය අනු ආකාර තුනකට බෙදා දක්වයි. මෙම අනු ආකාර තුන අතරින් 'ආයතනික සංස්කෘතික ප්‍රාග්ධනය' (Institutionalized Cultural Capital) සහ 'මූර්තිමත් සංස්කෘතික ප්‍රාග්ධනය' (Embodied/ Incorporated Cultural Capital) මෙකී සාකච්ඡාව සඳහා වඩාත් අදාළ වන බව පර්යේෂකයාට හැඟෙයි.

රතුගල ආදිවාසී ප්‍රජාවේ ආයතනික සංස්කෘතික ප්‍රාග්ධනය තක්සේරු කර බලන විට පැහැදිළි වන්නේ මේ වන තෙක් මෙකී ප්‍රජාවේ උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලද කිසිවෙක් නොමැති බව යි. රතුගල ආදිවාසී ප්‍රජාවේ වැඩිහිටියන්ගේ සාක්ෂරතාව ඉතාමත් ම දුර්වල ය. නමුත් ඔවුන්ට සාපේක්ෂව ළමා හා තරුණ පරම්පරාව අධ්‍යාපනය අතින් යම්තාක් දුරකට ප්‍රගතිශීලී බවක් පෙන්නුම් කරයි. නමුත් දෙමාපිය පරම්පරාවේ ඇති සාක්ෂරතා දුර්වලත්වය නොහොත් අධ්‍යාපනික ලැග්ම (educational lagging) හේතුවෙන් තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා කිසිදු බලගැන්වීමක් සිදුකිරීමට පවා රතුගල දෙමාපියන්ට නොහැකි වී තිබේ. රජය විසින් සියලු පාසල් වසා දැමීමට නිවේදනය කිරීමත් සමඟ රටෙහි අනෙකුත් සියලු ම පාසල් දරුවන් මෙන් රතුගල ආදිවාසී ගම්මානයේ පාසල් දරුවෝ ද නිවෙස්වලට කොටු වූහ. පාසල් ඉගැන්වීම් මාර්ගගත අධ්‍යාපනය ඔස්සේ ලබාදීම සිදුකරනු ලැබුවත් එය කිසිදු අයුරකින් රතුගල

ආදිවාසී දරුවන් කෙරෙහි කෘත්‍යාත්මක වූ බවක් නොපෙනෙයි. මක්නිසාද යත් ඔවුන්ගේ රතුගල ගම්මානය පිහිටා තිබෙන්නේ සිග්නල් සංඥා ආවරණයන්ගෙන් සහමුලින් ම මුක්ත කලාපයක වන බැවිනි.

කිසිදු සිග්නල් සංඥා ආවරණයක් නොමැති කලාපය සම්පූර්ණ කිලෝමීටර 37ක් පුරාවට විහිදෙයි. රතුගල ආදිවාසී ගම්මානයේ දරුවන් සිග්නල් ආවරණයක් ලබාගැනීමට නම් තම ගම්මානයේ සිට බිබිල-අම්පාර මාර්ගයේ අම්පාර දෙසට තවත් කිලෝමීටර කිහිපයක් පැමිණිය යුතු ය. එහිදී නාමල්ඔය දුරකථන කුළුණ හමුවන අතර ඔවුන්ගේ පාසල් වැඩකටයුතු බාගත කරගැනීමට නම් එම ස්ථානයට පැමිණීම අනිවාර්ය වෙයි.

මෙවන් තත්ත්වයක් පවතිද්දී රතුගල ආදිවාසී ගම්මානයේ ළමයි කොවිඩ් වසංගතයත් සමග අධ්‍යාපනයෙන් ක්‍රමිකව ඈත් වූ බව පෙනේ. ඔවුන්ගේ දෙමාපියන් සමග මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන විට ඔවුන් නිරන්තරයෙන් ම තමන්ට ප්‍රමාණවත් අධ්‍යාපනයක් නොමැතිකම සහ ඒ හේතුවෙන් තම දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳ සැළකිල්ලක් දැක්වීමට නොහැකිවීම පිළිබඳව පසුතැවිල්ලෙන් කතාකරනු ප්‍රත්‍යක්ෂ විය. නියැදියේ එක් ප්‍රතිග්‍රාහකයෙකු විසින් දක්වන ලද පහත උද්ධෘතයෙන් ඒ බව මනාව පැහැදිළි වෙයි.

"ඒ වෙද්දි අපි අපේ පුතාව එක වසරට ඇතුළත් කළා විතර යි. හරියට ම පහුවෙනිදා රට පුරා ම ඇඳිරි නීතිය දැම්මා. එදා ඉඳලා අද වෙනකන් පුතා ඉස්කෝලෙ ගියෙ නැහැ. දැන් එයා දෙක වසරට පාස් වෙලා තියෙනවා. හැබැයි තවමත් එයාට ලියන්නවත් කියවන්නවත් බෑ. අපි ඇත්තට ම ඉගෙනගෙන නැහැ. මම ඉගෙනගෙන තියෙන්නේ 3 වසරට විතර යි. මටවත් මගේ නෝනටවත් දරුවට උගන්නන්න තරම් දැනුමක් නැහැ. රතුගල ඉස්කෝලෙට උගන්නන්න එන හැම ගුරුවරයෙක් ම එන්නෙ බිබිල නැත්තං අම්පාරෙ ඉඳල. අපේ ගමේ එක පාසල් ගුරුවරයෙක්වත් නැහැ. ඉතින් ඒ හින්දා රට ආපහු තිබ්බ තත්ත්වෙට පත්වෙනකන් අපිට දරුවගෙ අධ්‍යාපනේ ගැන බලාපොරොත්තුවක් තියාගන්න බෑ" (ක්ෂේත්‍ර දත්ත 18/07/2021).

ඉහත ප්‍රකාශනය තුළින් පැහැදිළි වන්නේ රතුගල ආදිවාසී ප්‍රජාවේ පවත්නා ආයතනික සංස්කෘතික ප්‍රාග්ධන හිඟකම කොවිඩ් වසංගත තත්ත්වය තුළ සුවිශේෂී භූමිකාවක් රඟදක්වා තිබෙන බව යි. එමෙන්ම රතුගල ආදිවාසී දෙමාපියන් සතුව පවත්නා ආයතනික සංස්කෘතික ප්‍රාග්ධන හිඟකම ඔවුන්ගේ දරුවන් වෙතට ද සම්ප්‍රේෂණය වීමේ ඉඩකඩක් පවතින බව ද ප්‍රත්‍යක්ෂ විය. ඒ අනුව එය පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වන්නා වූ විෂම චක්‍රයක් බවට පත්වීමේ හැකියාවක් ද පවතී.

බොඩියුසියානු සාකච්ඡාව තුළ මූර්තිමත් සංස්කෘතික ප්‍රාග්ධනය යන්නෙන් අදහස් කෙරෙන්නේ යම් පුද්ගලයෙක් උපතින් රැගෙන එන හෝ සිය සමාජානුයෝජන ක්‍රියාවලිය මඟින් අත්පත්කරගන්නා සංස්කෘතික ප්‍රාග්ධනය යි. එමෙන්ම යම්කිසි පුද්ගලයෙක් හෝ පුද්ගල කණ්ඩායමක් හෝ සතුව පවත්නා නිපුණතාවන්, දක්ෂතාවන්, රුචිකත්වයන් සහ ආකල්පයන් ද මූර්තිමත් සංස්කෘතික ප්‍රාග්ධනය ලෙසින් සැළකිය හැකි ය (Bourdieu, 1993). එකී නිපුණතාවන්, දක්ෂතාවන්, රුචිකත්වයන් සහ ආකල්පයන් අදාළ පුද්ගලයන් වෙත පාරම්පරික ආවේණිය මඟින් ම උරුම වන්නා වූ කාරණා ද විය හැකි ය. ඒ අනුව රතුගල ආදිවාසී ප්‍රජාවගේ මූර්තිමත් සංස්කෘතික ප්‍රාග්ධනය සම්බන්ධයෙන් කතාකරන විට කොවිඩ් වසංගත තත්ත්වය තුළ ඔවුන්ගේ මූර්තිමත් සංස්කෘතික ප්‍රාග්ධනය සම්බන්ධයෙන් සතුටුදායක වාතාවරණයක් නිර්මාණය වුණු බව පර්යේෂකයාට පෙනෙයි.

රතුගල ආදිවාසී ගම්මානයේ දරුවන්ට තමන්ගේ මූර්තිමත් සංස්කෘතික ප්‍රාග්ධනය සම්බන්ධයෙන් හොඳ හැදෑරීමක් කිරීමට කොවිඩ් වසංගතය විභව අවකාශයක් සකසා දුන් බව ප්‍රත්‍යක්ෂ්‍ය ය. මක්නිසාදයත් පාසල් අධ්‍යාපනය (ආයතනික සංස්කෘතික ප්‍රාග්ධනය) ද ඇණහිටි අවස්ථාවක රතුගල ආදිවාසී දරුවන්ට තම දෙමාපියන්ගේ මගපෙන්වීම පරිදි වනාන්තරය, පරිසරය, ගස්වැල්, ඖෂධ, සහ සුළු සුළු දඩයම් කටයුතු කිරීම වැනි කාර්යයන් (මූර්තිමත් සංස්කෘතික ප්‍රාග්ධනය) පිළිබඳව පුහුණුවක් ලැබීමට ඉඩ ප්‍රස්තාව නිර්මාණය වූ බැවිනි. වසරක් පුරාවට ම පාසල් අධ්‍යාපනයෙන් ඈත් වී සිටි රතුගල ආදිවාසී දරුවන් තමන්ගේ පියවරුන් සමග මී පැණි කැඩීම වැනි කටයුතු සඳහා යාබද වනාන්තරයට නිරන්තරයෙන් යාම් ඊම් කිරීමට පටන් ගත් බව ඔවුන්ගේ දෙමාපියන් සමග කරන ලද සාකච්ඡාවල දී පර්යේෂකයාට දැනගැනීමට ලැබිණි. මේ අනුව සිය පාරම්පරික උරුමය සම්බන්ධයෙන් අන් කවරදාකටත් වඩා ප්‍රායෝගික වශයෙන් ම අත්දැකීම් ලබාගැනීමට රතුගල ආදිවාසී දරුවන්ට කොවිඩ් වසංගතය විසින් අවස්ථාවක් උදාකර දෙනු ලැබූ බව පෙනෙයි.

නමුත් ගැටලුව වන්නේ කොවිඩ් වසංගත තත්ත්වය තුළ රතුගල ආදිවාසී දරුවන් මූර්තිමත් සංස්කෘතික ප්‍රාග්ධනය කෙතරම් අත්පත් කරගත්තත් එකී මූර්තිමත් සංස්කෘතික ප්‍රාග්ධනය කොරෝනා වසංගතය තුරන් වූ කලෙක කිනම් ආකාරයක ජීවනෝපාය මාර්ගයක් සඳහා උපස්ථම්භක වන්නේ ද යන කාරණාව යි. රතුගල ආදිවාසී දරුවන් වනාන්තරයත් සමග ම ගැටෙමින් තමන්ගේ ඉදිරි ජීවිත කාලයත් ජීවත්වීමට අදහස් කරන්නේ නම් ඔවුන් ලබාගන්නා මූර්තිමත් සංස්කෘතික ප්‍රාග්ධනය අතිශයින් ම වටී. නමුත් ඔවුන්ට ගැටෙන්නට සිදුවන්නේ නූතනත්වය සමග යි. නූතනත්වය තුළ වඩාත් අගය කෙරෙන්නේ ඔවුන් අද අත්පත්කරගන්නා මූර්තිමත් සංස්කෘතික ප්‍රාග්ධනයට වඩා ආයතනික සංස්කෘතික ප්‍රාග්ධනය යි. එබැවින්

කොවිඩ් වසංගත තත්ත්වය තුළ ආයතනික සංස්කෘතික ප්‍රාග්ධනයෙන් දුරස්ථ වී මූර්තිමත් සංස්කෘතික ප්‍රාග්ධනය වැළඳගන්නා රතුගල ආදිවාසී දරුවන්ගේ අනාගතය සැබැවින් ම ගැටලුකාරී ක්ෂිතිජ රේඛාවක ස්ථානගත වී තිබෙනු හඳුනාගත හැකි විය.

### 3.4 සංකේතාත්මක ප්‍රාග්ධනය, කොවිඩ් වසංගතය සහ රතුගල ආදිවාසී ප්‍රජාව

බෝඩියෝට අනුව සංකේතාත්මක ප්‍රාග්ධනය මගින් අදහස් කරන්නේ යම්කිසි පුද්ගලයෙකු මත හෝ පුද්ගල කණ්ඩායමක් මත හෝ යම් ප්‍රජාවක් මත කාලාන්තරයක් තිස්සේ සමාජය විසින් ආරෝපණය කරනු ලැබ ඇති ධනාත්මක හෝ ඍණාත්මක සමාජ ලේබල්කරණය යි. එකී සමාජ ලේබල්කරණය විටෙක අදාළ ප්‍රජාව මත පිළිගැනීමක් ඇතිකරනවා මෙන්ම විටෙක අදාළ ප්‍රජාව මත සමාජ කැළලක්, සමාජ අපකීර්තියක්, සහ අවප්‍රමාණ කිරීමක් ද ප්‍රක්ෂේපණය කරනු දැකිය හැකි ය (Bourdieu in Raymond and Adamson).

රතුගල ආදිවාසී ප්‍රජාව සම්බන්ධයෙන් මහා සමාජය තුළ කාලාන්තරයක් තිස්සේ ඍණාත්මක සමාජ සංජානනයක් (ill-perception) ගොඩනැගී තිබෙන බව හඳුනාගත හැකි විය. විශේෂයෙන් ම මෙකී ප්‍රජාව සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය නිලධාරී යාන්ත්‍රණය තුළ මෙම ඍණාත්මක සමාජ සංජානනය උග්‍ර ලෙස තැන්පත් වී තිබෙනු ප්‍රත්‍යක්ෂ විය. රතුගල ආදිවාසී ප්‍රජාව වෙනුවෙන් ඔවුන්ගේ අභිවෘද්ධිය තකා සිදුකරන බොහෝ කටයුතු හුදෙක් කාලය නාස්ති කිරීමක් සහ මුදල් නාස්ති කිරීමක් වශයෙන් සළකන්නට යටකී නිලධාරීන් පිරිස උනන්දු සහ උත්සුක බව පෙනී ගියේ ය. රතුගල ආදිවාසී ප්‍රජාව විසින් ම කරුණු දක්වන ලද පරිදි නිලධාරීන් ඔවුන් පිළිබඳව සිතන්නේ මෙපරිද්දෙනි; රතුගල ආදිවාසී ප්‍රජාව ඔවුන්ට රජයෙන් ලබාදෙන ආධාර දීමනා, වන්දි මුදල් සියල්ල අවභාවිත කරති. රතුගල ආදිවාසී ප්‍රජාව අතර කිසිදු ආකාරයක සමගියක්, එකමුතු බවක් නොමැත. ඔවුන්ට කොපමණ ආධාර මුදල් දුන්න ද කොපමණ ඔවුන් පිළිබඳව සොයාබැලුව ද ඔවුන් සැමවිට ම හඬගා පවසන්නේ නිලධාරීන් අප වෙනුවෙන් කිසිවක් නොකරන බව ය. අප පිළිබඳව සොයා නොබලන බව ය.

මෙහි දී මෙම සමාජ සංජානනයන් මගින් බෝඩියෝ විසින් හඳුන්වා දෙන ලද 'පුරුදු' (habitus) සංකල්පය පිළිබඳව සංඥා මාත්‍රයක් ද මතු කරන බව පර්යේෂකයාගේ හැඟීම යි. ඉහතින් සඳහන් කරන ලද ලක්ෂණ රතුගල ආදිවාසී ප්‍රජාව සතුව පවතිනවා විය හැකි ය. එසේ නොවනවා ද විය හැකි ය. නමුත් රතුගල ආදිවාසී ප්‍රජාව තුළ ප්‍රජාවක් වශයෙන් ඔවුන් සතුව පවත්නා පුරුදු ඔවුන්ගේ සංකේතාත්මක ප්‍රාග්ධනය ගොඩනැගීම සඳහා දායකත්වය සපයයි. ඉහත සඳහන් කරන ලද සමාජ සංජානනයන්ගෙන් ද ප්‍රත්‍යක්ෂ වන්නේ රතුගල ආදිවාසී ප්‍රජාව සතුව පවත්නා සංකේතාත්මක ප්‍රාග්ධනය ඔවුන් කෙරෙහි ප්‍රතිජානාත්මක බලපෑමක් එල්ල කළ හැකි සංකේතාත්මක ප්‍රාග්ධනයක් නොවන බව යි. එබැවින් දැනට රතුගල ආදිවාසී ප්‍රජාව සම්බන්ධයෙන් ගොඩනැගී ඇති සංකේතාත්මක ප්‍රාග්ධනය මගින් ඔවුන්ට මහගු ප්‍රතිලාභයක් ලැබිය හැකි යැයි පුරෝකතනය කිරීම අපහසු ය.

මෙපරිද්දෙන් රතුගල ආදිවාසීන් පිළිබඳව ගොඩනැගී ඇති ඍණාත්මක සමාජ සංජානනය කොවිඩ් වසංගත තත්ත්වය තුළ ඔවුන් කෙරෙහි ප්‍රතිශේධනාත්මක බලපෑම් ඇති කළ බව පෙනේ. අද වන විටත් රතුගල ආදිවාසී ප්‍රජාව එන්නත්කරණයට ලක්කිරීම සම්බන්ධයෙන් කිසිදු හඬක් නොනැගෙන්නේත් ඒ පිළිබඳව නිලධාරීන් උත්සුක නොවන්නේත් මේ නිසා විය හැකි ය. රුපියල් පන්දහසේ ආධාර මුදල ද රතුගල ආදිවාසී ප්‍රජාවට ලැබී තිබුණේ විවිධ අක්‍රමිකතා මධ්‍යයේ ය. රතුගල ආදිවාසී ගම්මානයේ සෑම පවුලක් ම සමෘද්ධි ආධාරවලින් යැපෙන්නෝ ය. එවන් තත්ත්වයක් තුළ රුපියල් පන්දහසේ ආධාර මුදල් ලබාගැනීමට ඔවුන්ට සම්පූර්ණ හිමිකාරීත්වයක් සහ අයිතියක් පවතී. නමුත් එකී ආධාර මුදල් ලබාගැනීමට ඔවුන්ගේ ගම්මානයෙන් ඉතාමත් ම සීමිත පවුල් සංඛ්‍යාවකට පමණි. කොවිඩ් වසංගත තත්ත්වය තුළ ඔවුන්ට අත්විඳින්නට සිදුවුණු මෙකී ප්‍රතිශේධනාත්මක සංග්‍රහයන් සියල්ල ඔවුන් කෙරෙහි නිලධාරී යන්ත්‍රණය තුළ හා මහා සමාජය තුළ නිර්මාණය වී පවතින ඍණාත්මක සමාජ සංජානනය තුළින් උද්භේද වූ තත්ත්වයක් බව අවසානයේ දී නිගමනය කිරීමට හැකි විය.


## 4. නිගමන සහ නිර්දේශ

**කොවිඩ් වසංගතය, රතුගල ආදිවාසී ප්‍රජාව සහ සිව්වැදෑරුම් ප්‍රාග්ධනයන්ගේ සමස්ත අතිපිහිතවීම (overall inter-play)**

මෙකී ශාස්ත්‍රීය සාකච්ඡාවේ අවසානය වශයෙන් කොවිඩ් වසංගත තත්ත්වය තුළ රතුගල ආදිවාසී ප්‍රජාව කෙරෙහි සිව්වැදෑරුම් ප්‍රාග්ධනයන් එකිනෙක සමඟ අතිපිහිත වෙමින් (inter-play) සමස්තයක් ලෙස රඟදැක්වූ භූමිකාව කවරාකාර ද යන්න සම්මර්ශනයට හසුකිරීම යෝග්‍ය යැයි හැඟේ. මෙතෙක් පර්යේෂකයා සිදුකළේ මෙකී එක් එක් ප්‍රාග්ධනය කොවිඩ් වසංගත තත්ත්වය තුළ රතුගල ආදිවාසී ප්‍රජාවට අත්පත්කර දුන් දායකත්වය තනි තනි විශ්ලේෂණයන්ට හසුකිරීම යි. මෙහිදී පර්යේෂකයා බලාපොරොත්තු වන්නේ කොවිඩ් වසංගත තත්ත්වය තුළ යටකී එක් එක් ප්‍රාග්ධනයන් තනි තනි ලෙස නොව සමස්තයක් ලෙස රතුගල ආදිවාසී ප්‍රජාවට එල්ල කළ බලපෑම පිළිබඳ සමාප්තීය නිගමනයක් ගෙන ඒම යි.


මේ අනුව පළමුවෙන් ම ප්‍රත්‍යක්ෂ වන කරුණ වන්නේ සිව්වැදෑරුම් ප්‍රාග්ධනයන්ගෙන් සමාජ ප්‍රාග්ධනය -එයිනුත් විශේෂයෙන් ම අන්තඃ සමාජ

ප්‍රාග්ධනය (intra social capital) කොවිඩ් වසංගත තත්ත්වය තුළ රතුගල ආදිවාසී ප්‍රජාවගේ නොනැසී පැවැත්ම සඳහා අතිශය කැපී පෙනෙන දායකත්වයක් ලබා දුන් බව යි. කොවිඩ් වසංගත තත්ත්වය තුළ සිව්වැදෑරුම් ප්‍රාග්ධනයන් රතුගල ආදිවාසී ප්‍රජාවට ලබාදුන් දායකත්වයේ ප්‍රමාණය අනුව එකී ප්‍රාග්ධනයන් අවරෝහණ රටාවට පෙළගැස්වූ විට එය පහත පරිදි වෙයි.




**රූප සටහන 4.** කොවිඩ් වසංගත තත්ත්වය තුළ සිව්වැදෑරුම් ප්‍රාග්ධනයන් රතුගල ආදිවාසී ප්‍රජාවට ලබාදුන් දායකත්වය

කොවිඩ් වසංගත තත්ත්වය තුළ සිව්වැදෑරුම් ප්‍රාග්ධනයන් විවිධ ප්‍රමාණයන්ගෙන් (in different magnitudes) එකිනෙක සමඟ අතිපිහිත වෙමින් (interplay) රතුගල ආදිවාසී ප්‍රජාව කෙරෙහි ක්‍රියාත්මක වූ අන්දම පහත රූප සටහන තුළ ඉදිරිපත්කර තිබේ.




**රූප සටහන 5.** කොවිඩ් වසංගත තත්ත්වය තුළ සිව්වැදෑරුම් ප්‍රාග්ධනයන් රතුගල ආදිවාසී ප්‍රජාවට දැක් වූ දායකත්වයේ ප්‍රමාණය

ඒ අනුව ඉහත රූප සටහනට අනුව කොවිඩ් වසංගත තත්ත්වය තුළ රතුගල ආදිවාසී ප්‍රජාවට වැඩිපුර ම දායකත්වයක් ලබා දී තිබෙන්නේ ඔවුන් සතුව පවතින සමාජ ප්‍රාග්ධනය යි. විශේෂයෙන් ම ඔවුන් සතුව පවත්නා අන්තඃ සමාජ ප්‍රාග්ධනය (intra social capital) ඔවුන් කෙරෙහි ප්‍රමාණාතික්‍රාන්ත ප්‍රතිජානාත්මක බලපෑමක් එල්ලකර තිබේ. ඊට අනතුරුව පිළිවෙළින් ආර්ථික ප්‍රාග්ධනය, සංස්කෘතික ප්‍රාග්ධනය හා සංකේතාත්මක ප්‍රාග්ධනය ඔවුන් කෙරෙහි බලපා තිබේ. කොවිඩ් වසංගත තත්ත්වය තුළ රතුගල ආදිවාසී ප්‍රජාවට අවම දායකත්වයක් ලබාදී තිබෙන්නේ සංකේතාත්මක ප්‍රාග්ධනය යි. රතුගල ආදිවාසී ප්‍රජාව කෙරෙහි සමාජය තුළ නිර්මාණය වී පවතින ඍණාත්මක සමාජ සංජානනය කොවිඩ් වසංගත තත්ත්වය තුළ ඔවුන් කෙරෙහි එල්ල කළ ප්‍රතිශේධනාත්මක බලපෑම

පර්යේෂකයා මීට ඉහත අවස්ථාවක දී ද සාකච්ඡාවට හසුකොට තිබේ.

ඉහත රූප සටහනෙහි වෘත්ත හතරෙන් ම එකිනෙක ඡේදනය වූ කලාපය පර්යේෂකයා 'කෘත්‍යාත්මක කලාපය' (Functional Zone) යන නාමයෙන් හඳුන්වා තිබේ. මක්නිසාදයත් ප්‍රාග්ධන ආකාර 4 ම එකිනෙක සමඟ අන්‍යොන්‍ය වශයෙන් (reciprocally) පොදුවේ ක්‍රියාත්මක වෙමින් (mutually) යම් පුද්ගලයෙකුගේ හෝ පුද්ගල කණ්ඩායමකගේ හෝ ප්‍රජාවකගේ සුබසිද්ධිය උදෙසා දායකත්වය ලබාදෙන්නේ මෙම කලාපය තුළ වන බැවිනි. එබැවින් සිව්වැදෑරුම් ප්‍රාග්ධනයන් භුක්තිවිඳින පුද්ගලයෙක් හෝ වේවා පුද්ගල කණ්ඩායමක් හෝ වේවා ප්‍රජාවක් හෝ වේවා ඒ සැම දෙනාගේ ම සිව්වැදෑරුම් ප්‍රාග්ධනයන් අතිපිහිත වන (inter-play) කෘත්‍යාත්මක කලාපය ප්‍රසාරණය වන ප්‍රමාණයට අනුලෝමව ඔවුන්ගේ ජීවිත ද වඩ වඩාත් ස්ථාවර වෙයි. ඒ අනුව අවසාන වශයෙන් පර්යේෂකයා එළැඹුණු නිගමන පහත පරිදි වේ.

I. කොවිඩ් වසංගත තත්ත්වය තුළ රතුගල ආදිවාසී ප්‍රජාවට වඩාත් ප්‍රතිජානාත්මක බලපෑමක් සහ දායකත්වයක් ලබා දී තිබෙන්නේ ඔවුන් සතුව පවත්නා සමාජ ප්‍රාග්ධනය යි.
II. එමෙන්ම කොවිඩ් වසංගත තත්ත්වය තුළ රතුගල ආදිවාසී ප්‍රජාවට අවම දායකත්වයක් ලබා දී තිබෙන්නේ ඔවුන්ගේ සංකේතාත්මක ප්‍රාග්ධනය යි.
III. රතුගල ආදිවාසී ප්‍රජාවගේ ප්‍රාග්ධන ආකාරයන් හතර ම එකිනෙක සමඟ අතිපිහිත වන කෘත්‍යාත්මක කලාපය අතිශය කුඩා ය. එම කෘත්‍යාත්මක කලාපය ප්‍රසාරණය වන්නේ නම් (එයින් අදහස් කරන්නේ සංකේතාත්මක ප්‍රාග්ධනය සහ සංස්කෘතික ප්‍රාග්ධනය වැනි කුඩා වෘත්තයන් විශාලනය වීම ඔස්සේ කෘත්‍යාත්මක කලාපය ද ප්‍රසාරණය වන බව යි. මෙතෙක් අවම දායකත්වයක් ලබාදුන් එම ප්‍රාග්ධන ආකාර යුගල ද රතුගල ආදිවාසී ප්‍රජාව වෙනුවෙන් ප්‍රතිජානාත්මක දායකත්වයක් ලබාදීමට පටන් ගත් විට ඔවුන්ගේ ජීවන මට්ටම නිසැකව ම ඉහළ යයි) වර්තමානයේ ඔවුන් අත්දකින කොවිඩ් වසංගතය ආශ්‍රිත සමාජ ආර්ථික ගැටලු ද වඩාත් සුමට ආකාරයෙන් නිරාකරණය කරගැනීමට ඔවුන් තුළ ශක්‍යතාවක් ගොඩනැගෙනු ඇත.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


Ball, S.J., Gerwitz, S. and Bowe, R. (1994). Parents, privilege and the education market-place. *Research Papers in Education,* 9(1), 3-29.

Bourdieu, P. (1984). *Distinction: A Social Critique of the Judgement of Taste.* London: Routledge.

Bourdieu, P. (2002). *Pierre Bourdieu, Le Nouvel Observateur.* Paris: France Press.

Bourdieu, P. (1993). *The field of Cultural Production: Essays on Art and Literature.* Cambridge: Polity.

Bourdieu, P. (2006). The Forms of Capital In Education, Globalization and Social Change. In H. Lauder, P. Brown, J. A. Dillabough & A. H. Hasley (Eds.), *Changing Patterns of Education in the Globalization*. Oxford: Oxford University Press.

Bourdieu, P. (1986). The forms of capital. In Richardson, J. (ed) *Handbook of Theory and Research for the Sociology of Education.* New York: Greenwood.

Bourdieu, P. (2005). *The Social Structure of the Economy.* Cambridge. Polity.

Carpiano, R. M. (2006). Towards a neighborhood resource-based theory of social capital for health: Can Bourdieu and Sociology help? *Social Science and Medicine*, 62(1), 165-175.

Grenfell, M. (2004). *Pierre Bourdieu: Agent Provocateur*. London: Continuum.

Grenfell, M. (2008). *Pierre Bourdieu: Language, Culture and Education*. Bern: Peter Lang.

Jenkins, R. (1992). *Pierre Bourdieu.* London: Routledge.

Mercurio, A. (2020 May 01). *How COVID-19 impacts indigenous communities*. Retrieved from https://www.ryerson.ca/news-events/news/2020/05/how/-covid-19-impactsindigenous-communities/

Palmater, P. (2020, March 25). *Canada is ignoring the gendered impacts of Covid-19 on indigenous women*. Retrieved from https://

canadiandimension.com/articles/view/Canada-ignoring-gendered-impacts-of-covid-19-on-indigenous-women.

Reay, D., Crozier, G. and Clayton, J. (2005). 'Strangers in Paradise'? Working-class Students in Elite Universities. *Sociology*, 43(6), 1103-1121.

Song, L. (2011). Social Capital and Psychological Distress. *Journal of Health and Social Bahaviour,* 52(11), 478-492.

Swartz, D. (1997). Pierre Bourdieu: The Cultural Transmission of Social Inequality. *Harvard Educational Review*, 47(4), 545-555.

Wilkinson, I. (2005). *Suffering. A Sociological Introduction*. Cambridge: Polity.

සම්පත් පැතිකඩ, (2020). මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.